00879

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව
උපාධි වැඩසටහන- 6 වන මට්ටම
අවසාන පරීක්ෂණය - **2023/2024**

**EPU6332 -** ප්‍රාථමික අධ්‍යාපනයේ සමකාලීන ගැටලු

කාලය - පැය දෙකයි. **(02)**

---

දිනය - **2025.06.29** වේලාව - පෙ.ව.**9.30** - පෙ.ව.**11.30** දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට ද (03) පමණක් පිළිතුරු සපයන්න.

<u>1 වන කොටස</u>

01. තුලනාත්මක අධ්‍යාපනය හැදෑරීමෙන් ගුරුවරයෙකුට වන ප්‍රයෝජන පහක් **(05)** ලැයිස්තුගත කරන්න.

02. සමාජ සංස්කෘතික සංදර්භය තුළ බහු විධ සමාජය යන්න අර්ථ දක්වන්න.

03. "අධ්‍යාපනය මව්බසින් ලබා දිය යුතුය." මේ පිළිබඳ ඔබගේ විවේචන ඉදිරිපත් කරන්න.

04. ජාතික සමගිය ඇති කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් අධ්‍යාපන ක්‍රියාවලිය තුළ ගෙන ඇති පියවර තුනක් **(03)** හඳුනාගෙන සාකච්ඡා කරන්න.

05. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පාසල් කළමනාකරණය සම්බන්ධයෙන් හඳුනාගෙන ඇති අභියෝග පහක් **(05)** සාකච්ඡා කරන්න.

06. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයට ගෝලීයකරණය නිසා ඇති වූ යහපත් බලපෑම් තුනක් **(03)** පිළිබඳ ඔබේ අදහස සාධාරණීකරණය කරන්න.

07. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනයේ විෂයමාලාව හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සම්බන්ධයෙන් හඳුනාගෙන ඇති අභියෝග තුනක් **(03)** විස්තර කරන්න.

08. "ජපානයේ අධ්‍යාපනයේ නීතිමය අධිකාරිය" පිළිබඳ සංක්ෂිප්ත හැඳින්වීමක් කරන්න.

ලකුණු 05 X 08 =40



99

## 2 කොටස

09. I. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පාසල් මට්ටමේදී පහත දැක්වෙන ගැටළු මතුවීමට බලපා ඇති සාධක පැහැදිලි කරන්න.

අ. ජාතික මට්ටමේ විභාගවල ඇති තරඟකාරීත්වය

ආ. පෞද්ගලික උපකාරක පන්තිවල වර්ධනය (ලකුණු 05X02 = 10 )

II. ඉහත ගැටළු අවම කිරීම උදෙසා ජාතික හා පාසල් මට්ටමින් ගත හැකි ක්‍රියාමාර්ග තර්කානුකූල ව සාකච්ඡා කරන්න. (ලකුණු 10 )

10. I. බහුවිධ සමාජ නිසා අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ මතු වී ඇති ගැටළු පහක් (05) කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10 )

II. ප්‍රාථමික අධ්‍යාපන ගුරුවරයෙකු විසින් බහුවිධ සමාජ වලින් පැමිණෙන සිසුන්ට සමානාත්මතාව ආරක්ෂා වන පරිදි කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ උපායමාර්ග ඉදිරිපත් කරන්න. (ලකුණු 10 )

11. I. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියේ ගුණාත්මකබව විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 10 )

II. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මකබව ඉහළ නැංවීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න. (ලකුණු 10 )

12. පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සැලකිය යුතු දියුණුවක් දක්නට තිබුණ නමුත් පහත සඳහන් අඩුපාඩු ද එහි තවමත් ඉතිරිව ඇත.

- ✓ ප්‍රාථමික අධ්‍යාපන මට්ටමේ දී දරුවන් ලබන අධ්‍යාපනයේ ගුණාත්මක මට්ටම අඩු වීම.
- ✓ බොහෝ පාසල්වල ප්‍රාථමික අංශවල මනා කළමනාකරණ ක්‍රමයක් දක්නට නොවීම.

I. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඉහත අඩුපාඩු මතු වී ඇත්තේ කුමක් නිසා ද යන්න විශ්ලේෂණය කරන්න. (ලකුණු 10 )

II. ඔබ හඳුනාගත් අඩුපාඩු මගහරවා ගැනීමට ක්‍රමෝපායයන් යෝජනා කරන්න. (ලකුණු 10 )

13. I. නවසීලන්තයේ ඵලදායි පාසල්වල අධ්‍යාපනයේ ප්‍රවණතා සාකච්ඡා කරන්න. (ලකුණු 10 )

II. ඔබ ඉහත සඳහන් කළ අධ්‍යාපනයේ ප්‍රවණතා ළඟා කර ගැනීමට ශ්‍රී ලංකා අධ්‍යාපනයේ සිදුකළ යුතුයැයි ඔබ යෝජනා කරන වෙනස්කම් මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10 )

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*